# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,482 - 2026 මාර්තු මස 27 සිකුරාදා - 2026.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 17 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 02 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

“යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.”

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1307 - B 82774 - (2026/03)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ“

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල 'ක්වාසි' තනතුරු සඳහා ක්වාසි විනිසුරුවරුන් පත්කිරීම - 2026

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකුට මේ සඳහා අයදුම්කළ නොහැක.

අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිත වූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙකු විය යුතු ය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයා හට මසකට රුපියල් 7,500/- ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250/- ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කොට **2026 අප්‍රේල් මස 17** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය . අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

**ආනන්දි කනගරත්නම්,**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 27 දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573,
අලුත්කඩේ,
කොළඹ 12.

### උපලේඛනය

| | *ක්වාසි අධිකරණය* | *ක්වාසි අධිකරණ කලාපය* |
|---|---|---|
| 01 | අඩ්ඩාලච්චේනයි | අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 02 | අක්කරපත්තු | අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 03 | අනුරාධපුර | අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත, හුරුලුගම් පළාත සහ කලගම් පළාත ආදායම් කොට්ඨාසය |
| 04 | අවිස්සාවේල්ල | අවිස්සාවේල්ල අධිකරණ කලාපය |

| | *ක්වාසි අධිකරණය* | *ක්වාසි අධිකරණ කලාපය* |
|---|---|---|
| 05 | බලපිටිය සහ ඇල්පිටිය | ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය සහ ඇල්පිටිය අධිකරණ කලාපය |
| 06 | බේරුවල | කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 07 | බෝරා ප්‍රජාව | ශ්‍රී ලංකා බෝරා ප්‍රජාව |
| 08 | බියගම | ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම, දොම්පේ, කැළණිය සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 09 | කොළඹ නැගෙනහිර | කොළඹ අධිකරණ කලාපයට අයත් අළුත් කඩේ, ග්‍රෑන්ඩ්පාස්, මාලිගාවත්ත, සෙබස්ටියන් පාර, නිව් බසාර්, තොටහේන, කොච්චිකඩේ, කොටහේන, පාදුක්ක, හෝකන්දර, මීගොඩ, ගොඩගම, පනාගොඩ, මාලඹේ, තලංගම උතුර, කොටිකාවත්ත සහ බුත්ගමුව යන අධිකරණ බල ප්‍රදේශ |
| 10 | කොළඹ බටහිර | කොළඹ අධිකරණ කලාපයට අයත් දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, නුගේගොඩ, පැපිලියාන, මහරගම, පන්නිපිටිය, හෝමාගම, පොල්ගස්ඕවිට, ඉංගිරිය, රාජගිරිය, බත්තරමුල්ල සහ අතුරුගිරිය යන අධිකරණ බල ප්‍රදේශ |
| 11 | එරාවූර් | මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු ආදායම් බල ප්‍රදේශය |
| 12 | ගාල්ල | ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල අධිකරණ කලාපය |
| 13 | ගම්පහ | ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ, අත්තනගල්ල, මීරිගම සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
| 14 | හම්බන්තොට | හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට අධිකරණ කලාපය |
| 15 | හාරිස්පත්තුව සහ පූජාපිටිය | මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව සහ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 16 | ඉරක්කාමම් | අක්කරපත්තු අධිකරණ කලාපයේ වරිප්පොත්තාන්චේනයි, ඔට්ටිපුරම්, අමීරලිපුරම්, 10 කොට්ඨාසය ඒ, 11 කොට්ඨාසය ඒ, නල්ලවන්දිමලේ, ඉරක්කාමම් ග්‍රාමසේවා කොට්ඨාසයේ, 01 සිට 09 දක්වා වූ ප්‍රදේශ |
| 17 | කල්පිටිය | පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 18 | කළුතර | කළුතර දිස්ත්‍රික්කයේ කළුතර අධිකරණ කලාපය |
| 19 | මහනුවර | මහනුවර දිස්ත්‍රික්කයේ කඩවත් සතර සහ ගඟවට කෝරළය යන ආදායම් කොට්ඨාසය |
| 20 | කෑගල්ල | කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල අධිකරණ කලාපය |
| 21 | කුලියාපිටිය | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, දිවුරුම්පොල, ආරියගම, හෙට්ටිපොළ, පන්නල, බණ්ඩාරකොස්වත්ත, ඇලබඩගම, බුම්මාන, නාරම්මල, දඹදෙණිය, හොරොම්බාව, ඇතුන්ගහකොටුව, කැකුණගොල්ල, කොබෙයිගනේ, අරක්යාල සහ මෙම ප්‍රදේශයට අයත් අනිකුත් කුඩා ගම්මාන |
| 22 | කුරුණෑගල | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල අධිකරණ කලාපය |
| 23 | මන්නාරම | මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම සහ මාන්දයි ආදායම් කොට්ඨාසය |
| 24 | මේමන් ප්‍රජාව | ශ්‍රී ලංකා මේමන් ප්‍රජාව සඳහා |
| 25 | මොණරාගල | මොණරාගල දිස්ත්‍රික්යේ මොණරාගල අධිකරණ කලාපය |
| 26 | මුතූර් (කොඩ්ඩියාර් පත්තුව) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුව ආදායම් කොට්ඨාසය |
| 27 | නාවලපිටිය | මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ආදායම් කොට්ඨාසය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හබුගස්තලාව යන ප්‍රදේශ |
| 28 | නින්තවූර් | අම්පාර දිස්ත්‍රික්කයේ නින්තවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |

| | *ක්වාසි අධිකරණය* | *ක්වාසි අධිකරණ කලාපය* |
|---|---|---|
| 29 | නුවරඑළිය | නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවර එළිය අධිකරණ කලාපය |
| 30 | ඔට්ටමාවඩි | මඩකලපුව දිස්ත්‍රික්කයේ බටහිර කෝරලයිපත්තු ආදායම් කොට්ඨාසය |
| 31 | පහතහේවාහැට | මහනුවර දිස්ත්‍රික්කයේ පහත හේවාහැට උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය |
| 32 | පොතුවිල් | අම්පාර දිස්ත්‍රික්කයේ පානම්පත්තුව (පොතුවිල්) ආදායම් කොට්ඨාසය |
| 33 | පුල්මුඩේ | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැගෙනහිර සහ බටහිර කට්ටුකුලම්පත්තු ආදායම් කොට්ඨාසය |
| 34 | රත්නපුර | රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර අධිකරණ කලාපය |
| 35 | අවතැන්වූවන් | පුත්තලම දිස්ත්‍රික්කයේ වෙසෙන අවතැන්වූවන් සඳහා |
| 36 | සායින්තමරුදූ (කරවාහුපත්තු දකුණ) | අම්පාර දිස්ත්‍රික්කයේ සායින්තමරුදූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 37 | තම්ඹලගමුව සහ කන්තලේ | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 38 | තංගල්ල | හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධිකරණ කලාපය |
| 39 | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරය, ගුවට්ස් සහ මෝරාවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 40 | තුම්පනේ | මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 41 | ගම්පොල (උඩපළාත) | මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ (උඩපළාත) අධිකරණ කලාපය |
| 42 | වාලච්චේන (කෝරලයිපත්තුව) | මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලයිපත්තුව නැගෙනහිර (ඕට්ටමාවාඩි හැර) ආදායම් කොට්ඨාසය |
| 43 | යටිනුවර | මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ආදායම් කොට්ඨාසය |
| 44 | යාපනය | යාපනය දිස්ත්‍රික්කයේ යාපනය, පේදුරුතුඩුව හා කයිට්ස් අධිකරණ කලාපය |

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ ක්වාසිවරයකු පත්කිරීමේ ආදර්ශ අයදුම්පත**

---

ක්වාසි බල ප්‍රදේශය :- [ ]

1. මුලකුරු සමග නම :

උ:අබ්දූර් රහ්මාන් එම්.අයි.

2. සම්පූර්ණ නම :

උදා: මුහම්මදු ඉස්හාක් අබ්දූර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා.හැ.ප අංකය :

10. දුරකතන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම්

1. ________________________________________
2. ________________________________________
3. ________________________________________
4. ________________________________________
5. ________________________________________

12. වෘත්තීය සුදුසුකම්

1. ________________________________________
2. ________________________________________
3. ________________________________________
4. ________________________________________
5. ________________________________________

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන්:

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේද: ඔව් නැත

15. විවාහකද?: | ඔව් | | නැත | |

16. භාර්යාව ජීවත්ව සිටී ද? : | ඔව් | | නැත | |

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමඟ)

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපලවල වටිනාකම : | රු. | |

19. මාසික ආදායම : | රු. | |

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : | රු. | |

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? : | ඔව් | | නැත | |

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : | ඔව් | | නැත | |

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද? තිබේ ද ? : | ඔව් | | නැත | |

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතුය)

| | |
|---|---|
| නම: | නම: |
| ලිපිනය: | ලිපිනය: |
| දුරකථන අංක: | දුරකථන අංක: |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

.......................................
**ඉල්ලුම්කරුගේ අත්සන**

.......................................
**දිනය**

<u>සටහන</u>
සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න'

03 - 1135

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ ක්වාසි මණ්ඩලය සඳහා සභාපති හා සමාජිකයින් පත්කිරීම - 2026.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තිමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකුට (අධිකරණ නිලධාරියෙකු හැර) මේ සඳහා අයදුම් කළ නොහැක. අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40 ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිතවූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙකු විය යුතු ය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසි මණ්ඩලයේ සභාපතිවරයා හට මසකට රුපියල් 15,000/- ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 3,750/- බැගින් මසකට රුපියල් 15,000/- ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක් ද, සමාජිකයෙකුට රුපියල් 12,000/- ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 2,000/- බැගින් මසකට රුපියල් 8,000/- ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක් ද ගෙවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ “ක්වාසි මණ්ඩලය” යනුවෙන් සඳහන් කොට **2026 අප්‍රේල් මස 17** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය . අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

**ආනන්දි කනගරත්නම්,**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 27 දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573,
කොළඹ 12.

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය) යටතේ ක්වාසි මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් පත්කිරීමේ ආදර්ශ අයදුම්පත**

---

**දිස්ත්‍රික්කය :-**

1. මුලකුරු සමග නම :

උදා :අබ්දුර් රහ්මාන් එම්.අයි.

2. සම්පූර්ණ නම :

උදා : මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා.හැ.ප අංකය :

10. දුරකතන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම්

1. ______________________________
2. ______________________________
3. ______________________________
4. ______________________________
5. ______________________________

12. වෘත්තීය සුදුසුකම් :

1. ______________________________
2. ______________________________
3. ______________________________
4. ______________________________
5. ______________________________

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන්:

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේද: | ඔව් | | නැත | |

15. විවාහකද?: | ඔව් | | නැත | |

16. ඔබ නීතිඥවරයෙක් ද? : | ඔව් | | නැත | |

17. නීතිඥවරයෙකු නම් බඳවා ගන්නා ලද දිනය : | ව | ව | ව | ව | මා | මා | දි | දි |

18. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමඟ)

| *සිට* | *දක්වා* | *රැකියාව* | *ස්ථානය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

19. ඉල්ලුම්කරු සතු දේපළවල වටිනාකම : රු.

20. මාසික ආදායම : රු.

21. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

22. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? : | ඔව් | | නැත | |

23. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : | ඔව් | | නැත | |

24. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද? තිබේ ද ? : | ඔව් | | නැත | |

25. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතුය)

| | |
|---|---|
| නම: | නම: |
| ලිපිනය: | ලිපිනය: |
| දුරකථන අංක: | දුරකථන අංක: |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

....................................... .......................................

**ඉල්ලුම්කරුගේ අත්සන** **දිනය**

*සටහන*

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

03 - 1136

**ශ්‍රී ලංකා පොලීසිය**

ශ්‍රී ලංකා පොලීසියට උපසේවා සහකාර පොලිස් අධිකාරි, පිරිමි/ කාන්තා (නීති නිලධාරි) තනතුරට අයදුම්පත් කැඳවීම

2026.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 2477 හි 1 කොටස: (අ) වැනි කොටසේ පල කිරීම් යටතේ 02-222 නිවේදනයේ පළ කළ දැන්වීමෙහි අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2026.04.20 දින දක්වා දීර්ඝ කරමි.

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

2026 මාර්තු මස 23 දින,
කොළඹ 02,
පොලිස් මූලස්ථානයේ දී ය.

03 - 1149

---

**ශ්‍රී ලංකා පොලීසිය**

පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය පොලිස් සේවය /විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් (සාමාන්‍ය) සහ පොලිස් කොස්තාපල් (විශේෂ කාර්ය බලකාය) තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස “ join us” විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026.05.08 දිනට පෙර යොමුකල යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකල අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේ දී අයදුම්කරු විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කරු විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.)

(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත.

(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.

(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

**03.** **වැටුප් ක්‍රමය - (මාසිකව) පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය)**

රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% + රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (උ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඌ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |

**වැටුප් ක්‍රමය - (මාසිකව) පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය)**
**රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)**

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ව. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.
තවද, මෙම නිලධාරීන් 2022.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා පොලිසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |
| (උ) | දිරි දීමනාව | 1,500.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (ඌ) | මූලික වැටුපෙන් 25% ( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 12,387.50 |
| (එ) | ප්‍රභූ ආරක්ෂක (ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීමෙන් පසු ) | 800.00 |
| (ඒ) | සීතල දීමනාව 8% ( හිමිකම ඇති කඳවුරුවලට පමණි) | 3,964.00 |
| (ඔ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |
| (ඖ) | විවාහක දීමනාව( විවාහක නිලධාරීන් සඳහා) | 300.00 |

**මෙම දීමනාවලට අමතරව (විශේෂ කාර්ය බලකාය සහ සාමාන්‍ය පොලිස් සේවය )**

(අ) ප්‍රවාහන පහසුකම්

(ආ) නිලධාරීන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) නිල ඇඳුම්

(ඈ) සුදුසුකම් සපුරන නිලධාරීන්ට රාජ්‍ය විශ්වවිද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.

(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්

(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

**04 මූලික සුදුසුකම්**

**4:1** අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් දෙකකින් සමත් වීම.

සටහන 01 **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41 සහ 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද සළකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.**

සටහන 02 **අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂයෙහි ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද, එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.**

සටහන 03 **වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින්, එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.**

**4:2** කායික සුදුසුකම්

**සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.**

**4:3** වෙනත්

4:3:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

4:3:2 අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

4:3:3 අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන් සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:3:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.3.5 උස අඩි 05 අඟල් 04 හෝ ඊට වැඩි විය යුතුයි. (සෙන්ටිමීටර් 162.56)

4.3.6 පපුව අවම වශයෙන් හුස්ම නාල්ලා අඟල් 30 ක් විය යුතු ය. (සෙන්ටිමීටර් 76.2)

4:3:7 උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ඨිය 6/12 ට අඩු නොවිය යුතුය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය.

4:3:8 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

4:3:9 අයදුම්කරුගේ සමීප ඥාතීන් (මව, පියා, භාරකරු, සමීපව සම්බන්ධතා පවත්වන අවිවාහක හෝ විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයින්) අපරාධ වරදකට වරදකරු වී නොතිබීම.

සටහන 01 **තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4:1සහ 4:4 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:2 හා 4:3 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.**

සටහන 02 **ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවකුගේ උස පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.**

**4:4** වයස

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-24 ත් අතර විය යුතු ය.

**05.** බඳවා ගැනීමේ ක්‍රමය

**i. මූලික පරීක්‍ෂණය:**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්‍ෂණයේ දී ඉහත ඡේද 4:1, 4:2 හා 4:4 (4:3:1 , 4:3:2,4.3.4 ,4.3.7, 4.3.9 හැර) සුදුසුකම් පරීක්‍ෂා කරනු ලැබේ.

**ii. ඔරොත්තු දීමේ පරීක්‍ෂණය:**

මූලික පරීක්‍ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පතිවරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්‍ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තුදීමේ පරීක්‍ෂණයට මුහුණ දීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමඟ අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩිනම් | අසමත් |
| Chinup (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Situp (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්‍ෂා කිරීම) | අයිතමයන් නිරීක්‍ෂණය කිරීම සඳහා තත්පර 30 යි<br>ධාරණය කර ගැනීමට තත්පර 30 යි<br>ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 කි |

සටහන : 1. මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයක දී දිවීමට අසමත්වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්‍ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

2. සාමාන්‍ය පොලිස් සේවය සඳහා බඳවාගැනීමේ දී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු 50%ක්ද පොලිස් විශේෂ කාර්ය බලකාය සඳහා බඳවාගැනීමේ දී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු 60%ක්ද යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙසට සලකනු ලැබේ.

**06.** ලිඛිත විභාගය

ඔරොත්තුදීමේ පරීක්‍ෂණය පවත්වා අවසන් වීමෙන් පසු ඉන් සමත්වන අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගය පවත්වනු ලැබේ.

ලිඛිත විභාගය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය | 100 | 40 |

**07. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට අවරෝහණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛනය අනුව, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් පස් (5) ගුණයක් ( 1:5) පමණක් අවසන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පතිවරයා විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 40 |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී දක්වන කුසලතාවය | 20 | |
| **එකතුව** | **100** | |

08. **පසුබිම් පරීක්ෂණය**

8:1 ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කර ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණවන තෙක් අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

8:2 අයදුම්කරුවන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කරු පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් පසුබිම් පරීක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහි දී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් නුසුදුස්සන් සේ සළකුණු ලැබේ.

**09. වෛද්‍ය පරීක්ෂණය**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් සෞඛ්‍ය 169 පෝරමය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. අයදුම්කරුවන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන අදාළ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. සෞඛ්‍ය 169 පෝරම සහ ශ්‍රී ලංකා පොලිස් පූර්ව පත්වීම් වෛද්‍ය ඇමුණුම යන වාර්තා 02 මගින්ම යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

**10. පුහුණුව**

10:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් උපයාගත් ලකුණු ප්‍රමාණයේ අවරෝහණ ක්‍රමයට පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පත්කිරීමේ බලධාරියා විසින් නියම කරනු ලබන දිනක දී පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

10:2 මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබාදීම සිදුකරනු ලැබේ.

10:3 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරින්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම

අවලංගු කිරීම පත්කිරීමේ බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. එම තීරණය ප්‍රකාරව මූලික පුහුණුව දීර්ඝ කිරීමක් කළ හොත් එම කාලයට සමාන කාල සීමාවකින් පරිවාස කාලය දීර්ඝ කරනු ලැබේ.

**11. සේවා කොන්දේසි**

11:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 11:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

11:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

11:3 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලටද යටත් විය යුතු ය.

11:4 පරිවාස කාලය තුළ, සිටින නිලධාරියෙකු සම්බන්ධයෙන්වන සුවිශේෂී කරුණු පිළිබඳව සළකා බලා පොලිස්පතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් නම් කරන ලද නිලධරයකුගේ විශේෂ අවසරයක් ඇතුව මිස විවාහ විය නොහැක.

11:5 බඳවා ගන්නා අයදුම්කරුවන් බඳවා ගන්නා අවස්ථාවේ දී අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සඳහා ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හි දී පවත්නා නීති/ ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධි විධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

11:6 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

**12.** තනතුරේ ස්වභාවය ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. පත්වීම ස්ථිර කිරීම.**

13:1 පරිවාස කාලය තුළ දී ආධුනික ගොනුවක් පවත්වා ගෙන යා යුතුය. පරිවාස කාලය අවසානයේ දී එම නිලධාරින්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

13:2 පරිවාස කාලය තුළ දී පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධාරින්ගේ ජ්‍යෂ්ඨතාවය, කාර්ය පටිපාටික රීති අනුව තීරණය කරුනු ලබයි.

13:3 පරිවාස කාලයකට යටත්කොට ඇති නිලධාරියෙකුගේ පත්වීම ස්ථිර කිරීම, පරිවාස කාලය දීර්ඝ කිරීම හෝ පත්වීම අවසන් කිරීම පවත්නා කාර්ය පටිපාටික රීතීන්හි විධිවිධානයන්ට අනුකූලව පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**14. කාර්යක්ෂමතා කඩඉම :**

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තිය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | පොලිස්කොස්තාපල් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | පොලිස් සැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තිය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| **තුන්වන කාර්යක්ෂමතා කඩඉම** | **පොලිස් මහසැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර** | **තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම** |

**15.** **භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත්වීමට පෙර ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

16. මෙම *ගැසට්* පත්‍රයේ 1 කොටස (11 අ) ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

17. අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරුවන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේ දී උඩුගත (Upload) කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය
(*ආ*) ජාතික හැඳුනුම්පත
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(*ඈ*) වලංගු රියදුරු බලපත්‍රය
(*ඉ*) අයදුම්කරු තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය)
(*ඊ*) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේ දී අයදුම්පතේ අනු. අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................
මහතා .................................................................................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

..........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
නම.................................
දිනය ................................ නිල මුද්‍රාව

*සටහන -* **පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.**

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

03 - 1150/1

**ශ්‍රී ලංකා පොලීසිය**

කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය පොලිස් සේවය /විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය) සහ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය) සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස "join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී, මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර **2026.05.08** දිනට පෙර යොමුකළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මඟින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකළ අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේ දී අයදුම්කාරිය විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කාරිය විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.)

- **2020.01.24 දිනැති රජයේ *ගැසට්* නිවේදන අංක 2160 හා 2020.02.14 දිනැති රජයේ *ගැසට්* නිවේදන අංක 2163 *ගැසට්* නිවේදනයන්ට අයදුම්පත් යොමුකළ කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට බඳවාගැනීමට සුදුසුකම් ලබා සිටි අයදුම්කාරියන් හට "වයස් සීමාව නොසලකා හැර" අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් සාමාන්‍ය කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට පමණක් ඉල්ලුම්කළ හැක.**

(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත.

(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.

(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

**03.** **වැටුප් ක්‍රමය -** (මාසිකව) **කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය)**

රු. 49,550-7 x 540-27x 670 - රු. 71,420.00 (RS 1-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | *රු. ශත* |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (ඔ) | අර්ධද්වීප දීමනාව (යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |

**වැටුප් ක්‍රමය - (මාසිකව) කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය)**

රු. 49,550-7 x 540-27x 670 - රු. 71,420.00 (RS 1-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ව. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

තවද, මෙම නිලධාරිනියන් 2022.12.15 දිනැති ශ්‍රී ලංකා පොලිසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | *රු. ශත* |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු. 1,250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |
| (උ) | දිරි දීමනාව | 1,500.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා :

| | | *රු. ශත* |
|---|---|---|
| (ඌ) | මූලික වැටුපෙන් 25% ( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 12,387.50 |
| (එ) | ප්‍රභූ ආරක්ෂක (ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීමෙන් පසු ) | 800.00 |
| (ඒ) | සීතල දීමනාව 8% ( හිමිකම ඇති කඳවුරුවලට පමණි) | 3,964.00 |
| (ඔ) | අර්ධද්වීප දීමනාව (යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |
| (ඖ) | විවාහක දීමනාව (විවාහක නිළධාරින් සඳහා) | 300.00 |

**මෙම දීමනාවලට අමතරව (සාමාන්‍ය පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකාය)**

(අ) ප්‍රවාහන පහසුකම්
(ආ) නිලධාරිනියන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) නිල ඇඳුම්
(ඈ) සුදුසුකම් සපුරන නිලධාරිනියන්ට රාජ්‍ය විශ්වවිද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.
(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්
(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

**04. මූලික සුදුසුකම් :-**

**4:1 අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් පහ (05) ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් දෙකකින් සමත්වීම.

සටහන 01 **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41 සහ 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.**

සටහන 02 **අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂයෙහි ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද, එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.**

සටහන 03 වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින්, එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

**4:2** කායික සුදුසුකම් :-

**සෑම අපේක්ෂිකාවකම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වියයුතු ය.**

**4:3** වෙනත් :-

4:3:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

4:3:2 අයදුම්කාරිය අයහපත් චරිතයකින් යුක්ත නොවීම.

4:3:3 අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, ගර්භනීව සිටීම සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:3:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.3.5 උස අඩි 05 අඟල් 01 හෝ ඊට වැඩි විය යුතුයි. (සෙන්ටිමීටර් 154.94)

4:3:6 උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතු ය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය.

4:3:7 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

4:3:8 අයදුම්කාරියගේ සමීප ඥාතීන් (මව, පියා, භාරකරු, සමීපව සම්බන්ධතා පවත්වන අවිවාහක හෝ විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයින්) අපරාධ වරදකට වරදකරු වී නොතිබීම.

සටහන 01: **තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4:1 සිට 4:4 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:2 හා 4:3 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.**

සටහන 02: **ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ඨ ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කාරියකගේ උස පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.**

**4:4** වයස :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-24 ත් අතර විය යුතු ය.

**05.** බඳවා ගැනීමේ ක්‍රමය :-

**i.** **මූලික පරීක්ෂණය:**
අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කාරියන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කාරියන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත ඡේද 4:1(4:3:1, 4:3:2, 4:3:4, 4:3:6, 4:3:8 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

**ii.** **ඔරොත්තු දීමේ පරීක්ෂණය:**
මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කාරියන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. අයදුම්කාරියන් විසින් ඔරොත්තුදීමේ පරීක්ෂණයට මුහුණදීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

| ක්‍රියාකාරකම | කාලය | ලකුණු |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩිනම් | අසමත් |
| Chinup (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Situp (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි<br>ධාරණය කර ගැනීමට තත්පර 30 යි<br>ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 කි |

*සටහන :* **1.** මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයකදී දිවීමට අසමත්වන අයදුම්කාරියන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

**2.** සාමාන්‍ය පොලිස් සේවය සඳහා බඳවාගැනීමේදී ඉහත අභ්‍යාසවලින් මුළු ලකුණු 50%ක්ද පොලිස් විශේෂ කාර්ය බලකාය සඳහා බඳවාගැනීමේදී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු 60%ක්ද යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙසට සලකණු ලැබේ.

**06. ලිඛිත විභාගය :**

ඔරොත්තුදීමේ පරීක්ෂණය පවත්වා අවසන් වීමෙන් පසු ඉන් සමත්වන අයදුම්කාරියන් සඳහා ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

**07. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

ලිඛිත විභාගයෙන් සමත් වන අයදුම්කාරියන් අතරින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කාරියගේ සිට අවරෝහණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛණය අනුව, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් පස් (5) ගුණයක් ( 1:5) පමණක් අවසන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 40 |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 03. භාෂා හැකියාව | 10 | 40 |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී දක්වන කුසලතාවය | 20 | |
| එකතුව | 100 | |

08. **පසුබිම් පරීක්ෂණය**

8:1 ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කාරියන් ලබාගත් මුලු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කර ප්‍රමුඛතා ලේඛණයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වන තෙක් අවශ්‍ය අයදුම්කාරියන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

8:2 අයදුම්කාරියන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේද, ඇය සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කාරිය පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් පසුබිම් පරීක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහිදී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් නුසුදුස්සන් සේ සළකුණු ලැබේ.

**09. වෛද්‍ය පරීක්ෂණය**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කාරියන් සෞඛ්‍ය 169 පෝරමය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී අයදුම්කාරියන් පොලිස් රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද භාජනය කරනු ලැබේ. අයදුම්කාරියන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන අදාළ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. සෞඛ්‍ය 169 පෝරම සහ ශ්‍රී ලංකා පොලිස් පූර්ව පත්වීම් වෛද්‍ය ඇමුණුම යන වාර්තා 02 මගින්ම යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කාරියන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

**10. පුහුණුව**

10:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් උපයාගත් ලකුණු ප්‍රමාණයේ අවරෝහණ ක්‍රමයට පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පත්කිරීමේ බලධාරියා විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

10:2 මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබාදීම සිදුකරනු ලැබේ.

10:3 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරිනියන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීමේ බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. එම තීරණය ප්‍රකාරව මූලික පුහුණුව දීර්ඝ කිරීමක් කළ හොත් එම කාලයට සමාන කාල සීමාවකින් පරිවාස කාලය දීර්ඝ කරනු ලැබේ.

**11. සේවා කොන්දේසි**

11:1 තෝරා ගනු ලබන අයදුම්කාරියන් පහත 11:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

11:2 තෝරා ගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතු ය.

11:3 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස්

නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලටද යටත් විය යුතු ය.

11:4 පරිවාස කාලය තුළ, සිටින නිලධාරිනියක සම්බන්ධයෙන් වන සුවිශේෂී කරුණු පිළිබඳව සළකා බලා පොලිස්පතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් නම් කරන ලද නිලධරයකුගේ විශේෂ අවසරයක් ඇතුව මිස විවාහ විය නොහැක.

11:5 බඳවා ගන්නා අයදුම්කාරියන් බඳවා ගන්නා අවස්ථාවේ දී අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සඳහා ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හිදී පවත්නා නීති/ ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධි විධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

11:6 බඳවා ගැනීමේදී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

**12. තනතුරේ ස්වභාවය :**

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. පත්වීම ස්ථිර කිරීම :**

13:1 පරිවාස කාලය තුළ දී ආධුනික ගොනුවක් පවත්වා ගෙන යා යුතු ය. පරිවාස කාලය අවසානයේදී එම නිලධාරිනියන්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ

13:2 පරිවාස කාලය තුළදී පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධාරිනියන්ගේ ජොෂ්ඨතාවය, කාර්ය පටිපාටික රීති අනුව තීරණය කරනු ලබයි.

13:3 පරිවාස කාලයකට යටත්කොට ඇති නිලධාරිනියකගේ පත්වීම ස්ථිර කිරීම, පරිවාස කාලය දීර්ඝ කිරීම හෝ පත්වීම අවසන් කිරීම පවත්නා කාර්ය පටිපාටික රීතීන්හි විධිවිධානයන්ට අනුකූලව පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**14. කාර්යක්ෂමතා කඩඉම :**

| *කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | කාන්තා පොලිස් සැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | කාන්තා පොලිස් මහසැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |

**15.** **භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරිනියන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත්වීමට පෙර ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

16. මෙම *ගැසට්* පත්‍රයේ 1 කොටස (11 අ) ඡේදයේ ආරම්භයේ පල කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

17. අයදුම්කාරියන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛණවල පිටපත් අයදුම්පත් යොමුකරන අවස්ථාවේදී උඩුගත (Upload) කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය,
(*ආ*) ජාතික හැඳුනුම්පත,
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(*ඈ*) වලංගු රියදුරු බලපත්‍රය
(*ඉ*) අයදුම්කාරිය තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාල වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය),
(*ඊ*) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේදී අයදුම්පතේ අනු අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

> මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................................................................ මෙනවිය ........................................................................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.
>
> .........................................,
> ආයතන ප්‍රධානියාගේ අත්සන,
> නම.................................,
> දිනය : ................................. නිල මුද්‍රාව.

***සටහන* - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.**

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

03 - 1150/2

**ශ්‍රී ලංකා පොලීසිය**

පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (සාමාන්‍ය පොලිස් සේවය /විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (සාමාන්‍ය) පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (විශේෂ කාර්ය බලකාය) සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස " join us " විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී, මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026.05.08 දිනට පෙර යොමුකළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකල අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේදී අයදුම්කරු විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කරු විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.) :

**(අ) මෙම නිවේදනයේ සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය;**

**(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි;**

**(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත;**

**(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ;**

**(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.**

**03.** **වැටුප් ක්‍රමය .- (මාසිකව)- පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (සාමාන්‍ය)**

රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත:

| | | *රු. ශත* |
|---|---|---|
| (*අ*) | මූලික වැටුප | 49,550.00 |
| (*ආ*) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (*ඇ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (*ඈ*) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (*ඉ*) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (*ඊ*) | දුෂ්කර දීමනාව | 2,000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා :

| | | |
|---|---|---|
| (*ඔ*) | අර්ධද්වීප දීමනාව (යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (*ඕ*) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |

**වැටුප් ක්‍රමය .- (මාසිකව)- පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (විශේෂ කාර්ය බලකාය)**

රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

තවද, මෙම නිලධාරීන් 2022.12.15 දිනැති ශ්‍රී ලංකා පොලිසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |
| (උ) | දිරි දීමනාව | 1,500.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා :

| | | |
|---|---|---|
| (ඌ) | මූලික වැටුපෙන් 25% ( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 12,387.50 |
| (එ) | ප්‍රභූ ආරක්ෂක (ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීමෙන් පසු ) | 800.00 |
| (ඒ) | සීතල දීමනාව 8% ( හිමිකම ඇති කඳවුරු වලට පමණි) | 3,964.00 |
| (ඔ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |
| (ඖ) | විවාහක දීමනාව( විවාහක නිළධාරින් සඳහා) | 300.00 |

මෙම දීමනා වලට අමතරව (විශේෂ කාර්ය බලකාය සහ සාමාන්‍ය පොලිසිය) :

(අ) ප්‍රවාහන පහසුකම්
(ආ) නිලධාරින්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) සියලුම නිල ඇඳුම් ශ්‍රී ලංකා පොලිසියෙන් සපයනු ලැබේ.
(ඈ) සුදුසුකම් සපුරන නිලධාරින්ට රාජ්‍ය විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.
(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්
(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරී සඳහා තැගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

**04. අවශ්‍ය මූලික සුදුසුකම් :**

**4:1 වයස් සීමාව**

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය.

**4:2 අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

**සටහන 01:** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41 සහ 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02:** අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

**4:3 වෘත්තීය සුදුසුකම් -**

සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**සටහන 01:** **මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම හෝ මෝටර් රථ අලුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද හෝ දිගුකාලීනව රිය පැදවීමේ පලපුරුද්ද වෙනුවෙන් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.**

**4:3 කායික සුදුසුකම්**

- උස අඩි 05 අඟල් 02 හෝ ඊට වැඩි විය යුතු යි. (සෙන්ටිමීටර් 157.48 )
- පපුව අඟල් 30 හෝ ඊට වැඩි විය යුතු යි. (සෙන්ටිමීටර් 76) හුස්ම නාල්ලා

4:3:1 සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4:3:2 **දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් -** උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය. උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන කවර හෝ අයදුම්කරුවෙකු සුදුස්සෙකු නොවනු ඇත.

4:3:3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරීවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

**4:4 වෙනත් සුදුසුකම්**

4:4:1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

4:4:2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නොවිය යුතු ය.

4:4:3 අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන් සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:4:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4:4:5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 4:1 සහ 4:2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.

**05. මූලික පරීක්ෂණය :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත ඡේද 4:1, 4:2 හා 4:3 (4:3:1 හා 4:3:2 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තුදීමේ පරීක්ෂණයට මුහුණදීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

මූලික පරීක්ෂණයෙන් සමත් වන සියලු අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයට යොමු කරන අතර, එහි දී මීටර් 1000 ක දුරක් විනාඩි 05 කට වඩා අඩු කාලයක් තුළදී සම්පූර්ණ කිරීම (දිවීම) යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් ලෙස සලකනු ලැබේ.

***සටහන :*** මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයකදී දිවීමට අසමත් වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

**06. වෘත්තීමය පරීක්ෂණය :**

මූලික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් වෘත්තිමය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. වෘත්තිය පරීක්ෂණය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | |
|---|---|---|---|
| 01. ලිඛිත | 40 | 20 | 50 % |
| 02. ප්‍රායෝගික පරීක්ෂණය | 60 | 30 | |

**07.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

මූලික පරීක්ෂණයෙන් හා වෘත්තීයමය පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 02. කාර්මික දැනුම/ භාෂා දැනුම/ පරිගණක හැකියාව/ වෙනත් | 20 | |
| 03. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 04. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

08. **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

වෘත්තීය පරීක්ෂණයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබා ගත් මුලු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනු පිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125 % ක අයදුම්කරුවන් ගණනක් පසුබිම් පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණයන්ට කැඳවා ඉන් සමත්වන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

*සටහන :* ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකි ය.

**09.** **පසුබිම් පරීක්ෂණය :**

9:1 ඉහත ඡේද 08 පරිදි බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් යහපත් චරිතය තහවුරු කරගැනීම සඳහා පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලබයි.

9:2 මෙහි දී අයදුම්කරුගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ද ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වන ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

9:3 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවකදී පත්වීම අවලංගු කිරීම,සේවයෙන් පහ කිරීම සිදුකරනු ලැබේ.

*සටහන:* කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ වගන්ති 59 හි හා දැනට අනුමත බඳවා ගැනීම් පටිපාටියේ වගන්ති 7:2:4:5:2 හා පොලිස්පති චක්‍රලේඛ 2014/ 2007 හි සඳහන් කරුණුවලට අදාළව අසත්‍ය තොරතුරු සපයා පොලිස් සේවයට බැඳී ඇති බවට අනාවරණය වුවහොත් ඔබ සේවයෙන් ඉවත් කිරීමට ගනු ලබන තීරණයන්ට එකඟ විය යුතු ය.

**10. වෛද්‍ය පරීක්ෂණය :**

අයහපත් පසුබිම් වාර්තා නොමැති අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් අධ්‍යක්ෂ පොලිස් වෛද්‍ය සේවා ඇතුලු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මෙහිදී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදු කරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

**11. පුහුණුව :**

11:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පති විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ ලබාදෙන අතර, ඉන් පසුව ආධුනික කාලය අවසන් වන තෙක් අදාල ක්ෂේත්‍ර පුහුණුව ලබා දීම සිදුකරනු ලැබේ.

11:2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරීන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

**12. තනතුරේ ස්වභාවය :**

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. සේවා කොන්දේසි :**

13:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 13:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

13:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතු ය.

13:3 රාජ්‍ය සේවා කොමිෂන් සභා, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධි විධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලටද යටත් විය යුතු ය.

13:4 ආධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03 ක් සඳහා බල පැවැත්වෙන අතර, එම කාලය තුළ දී නිලධරයා හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස්පති චක්‍රලේඛවලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කළ හොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13:5 බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සේවය කළ යුතු ය. මෙම අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඔහුගේ පුහුණුව හා නිල ඇඳුම් ඇතුලු අනෙකුත් වියදම් වෙනුවෙන් නියම කරනු ලබන මුදල් සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පල කිරීමේ ගිවිසුමකට එළඹිය යුතු ය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභා හා රාජ්‍ය සේවා කොමිෂන් සභා විධි විධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

13:6 ඉදුරාම බඳවා ගන්නා සෑම නිලධාරියකුම පොලිස් සේවයට පළමුවෙන් පත් කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන්ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නා වූ හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳවද තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳවද විස්තර සිය පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන පොදු ආකෘති පත්‍රයේ ඇතුළත් කර පොලිස්පති වෙත සැපයිය යුතු ය.

නිලධාරියා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධවද ඇතුළත් කර සැපයිය යුතු ය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කර ගනු ලැබුව හොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳවද සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින්ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතු ය.

13:7 ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු නිලධාරීන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතු ය.

**14. පත්වීම ස්ථිර කිරීම.**

14.1 බඳවාගත් නිලධාරින් වසර 03 ක කාලය තුළදී මාසිකව පවත්වනු ලබන ප්‍රගති ගොණුවක් මාස 33ක් පවත්වාගෙන යා යුතු ය. පරිවාස කාලය අවසානයේදී නිලධාරීන්ගේ සේවය පත්කිරීම් බලධරයා විසින් ස්ථිර කරනු ලැබේ.

14.2 තවද පරිවාස කාලය තුළ දී පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත් වීමට අපොහොසත්වන නිලධාරීන්ගේ ජොෂ්ඨත්වය, පලමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීමට ගතවන අමතර කාලය මත කාර්ය පටිපාටික රීති අනුව තීරණයකර, පත්කිරීම් බලධාරියා විසින් සේවය ස්ථිර කරනු ලබයි.

එසේ වුවද අමතර වසර 03 ක කාලය තුළ පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වන නිලධාරින්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කළහොත් පත්වීම අවසන් කරනු ලැබේ.

**15. කාර්යක්‍ෂමතා කඩඉම :**

**කාර්යක්‍ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.**

| *කුමන කාර්යක්‍ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්‍ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්‍ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/ වෘත්තීය පරීක්‍ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්‍ෂණය) | පොලිස් කොස්තාපල් රියදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත හා ප්‍රායෝගික |
| 2 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය | පොලිස් සැරයන් රියදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය | පොලිස් මහසැරයන් රියදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 4 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය | උප පොලිස් පරීක්‍ෂක (ප්‍රවාහන) තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |

**16. භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 01/ 2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

**17.** මෙම *ගැසට්* පත්‍රයේ 1 කොටස (11 අ) වැනි ඡේදයේ ආරම්භයේ පල කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

18. අයදුම්කරුවන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛණවල පිටපත් අයදුම්පත් යොමුකරන අවස්ථාවේදී උඩුගත (upload) කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය,
(*ආ*) ජාතික හැඳුනුම්පත,

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) වලංගු රියදුරු බලපත්‍රය,
(ඉ) අයදුම්කරු තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය),
(ඊ) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේදී අයදුම්පතේ අනු අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

> මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................
> මහතා ......................................................................................... දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.
>
> ........................................,
> ආයතන ප්‍රධානියාගේ අත්සන,
> නම.................................,
> දිනය : ................................ නිල මුද්‍රාව.

*සටහන* - **පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.**

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

03 - 1150/3

---

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

**සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීමට මේ සඳහා උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 ව්‍යවස්ථාව යටතේ, සීමා නිර්ණය කොමිෂන් සභාව, ගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන, දේශපාලන කටයුතුවලට නිරතව නොසිටින්නා වූ තැනැත්තන් වශයෙන් ගරු ජනාධිපතිතුමා සලකන්නා වූ තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ 'සීමා නිර්ණය' කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026 අප්‍රේල් මස 10 දින** හෝ ඊට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ (constitutionalcouncil@parliament.lk) යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් පණිවුඩයේ විෂයය ලෙස 'සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 මාර්තු මස 26 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

03 - 1194

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### මුදල් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ සහ 154ජ ව්‍යවස්ථා යටතේ මුදල් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීම සඳහා, එක් එක් තැනැත්තා, මූල්‍ය, නීතිය, පරිපාලනය, ව්‍යාපාර හෝ ශාස්ත්‍රීය යන ක්ෂේත්‍රයක කැපී පෙණුනු හෝ උසස් නිලතල දැරූ තැනැත්තන් විය යුතු ප්‍රධාන ජන වර්ග තුන නියෝජනය කරන්නා වූ, මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ 'මුදල්' කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 අප්‍රේල් මස 10 දින හෝ ඊට පෙර,

> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
> ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
> ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ (constitutionalcouncil@parliament.lk) යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් පණිවුඩයේ විෂයය ලෙස 'මුදල් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 මාර්තු මස 26 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

03 - 1195

---

### ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ සහ 155අ (1) ව්‍යවස්ථා යටතේ, සහ 155අ (2) සහ 155අ(3) ව්‍යවස්ථාවන්ට යටත්ව, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීමට නිර්දේශ කරනු ලැබීම සඳහා , මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ 'ජාතික පොලිස්' කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 අප්‍රේල් මස 10 දින හෝ ඊට පෙර,

> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
> ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
> ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ (constitutionalcouncil@parliament.lk) යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් පණිවුඩයේ විෂයය ලෙස 'ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 මාර්තු මස 26 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

03 - 1196